# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමු වසර පරීක්ෂණය (බාහිර) - 2010**
**2011 දෙසැම්බර් /2012 ජනවාරි**

**BCOM E 1054 - ව්‍යාපාර නීතිය**

මුළු ප්‍රශ්ණ සංඛ්‍යාව 08 යි. කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්ණ පහකට (05) පිළිතුරු සපයන්න.

(01) (අ) (i) අර්පණය යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 04)

(ii) අර්පණයක් අවසාන වන ක්‍රම මොනවාදැයි නිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 16)

(මුළු ලකුණු 20)

(02) (අ) "සියළුම ගිවිසුම් සම්මුතීන් වන අතර සියළුම සම්මුතීන් ගිවිසුම් නොවේ." සුදුසු නිදසුන් යොදාගනිමින් මෙම ප්‍රකාශයෙහි ඇති වලංගුතාවය විමසන්න.

(ලකුණු 10)

(ආ) අජිත් සිය ඉඩම රුපියල් ලක්ෂ 5 කට සේනකට විකිණීම පිණිස අර්පනයක් ඉදිරිපත් කරන ලදී. සේනක අර්පනය ප්‍රතිග්‍රහණය කළ අතර ඒ සමග රු. 100,000/= වටිනාකමින් යුත් චෙක්පතක් එවූ අතර ඉතිරි මුදල රු. 50,000/= බැගින් වූ මාසික වාරික මඟින් ගෙවීමට ද පොරොන්දු විය. අජිත් සහ සේනක අතර ගිවිසුමක් හට ගෙන ඇත්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

(03) (අ) සොනාලි, සි/ස පවන රූපවාහිනී ආයතනය සමග එක්තරා ජනප්‍රිය වෙළඳ රූපවාහිනී වැඩසටහනක් මෙහෙයවීම සඳහා නිවේදිකාවක් ලෙස කටයුතු කිරීමට ගිවිසුමකට එළඹුනි. අදාල එකඟත්වයට අනුව ඇය ඉරිදා හැර සෑම දිනකම රාත්‍රී කාලයේදී එම වැඩසටහන සඳහා සහභාගී විය යුතුය. හදිසියේම ඇය රෝගාතුර වූ අතර, වෛද්‍යවරුන්ගේ උපදේශය වූයේ ඇයගේ නිවේදන කටයුතු සතියකට දින 03 කට සීමා කළ යුතු බවයි. ඇයගේ සේවය තවදුරටත් ලබා ගැනීම රූපවාහිනී ආයතනය ප්‍රතික්ෂේප කරයි. සොනාලි මේ සම්බන්ධයෙන් ඔබගෙන් උපදෙස් පතයි.

(ලකුණු 08)

(ආ) වන්දි ගෙවීම සම්බන්ධයෙන් අදාල වන රීති මොනවාදැයි පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර සඳහා සුදුසු නිදසුන් යොදා ගන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

(04) "පොරොන්දු වූ පරිදි ගිවිසුමක් ඉෂ්ඨ කිරීමට අපොහොසත් වීමේ වගකීම සම්පූර්ණයෙන් බැහැර කිරීමට හෝ සීමා කිරීම සඳහා විකුණුම්කරුවන් වගකීම බැහැර කිරීමේ වගන්ති ගිවිසුම් වලට ඇතුලත් කරනු ලැබේ." මෙසේ වගකීම බැහැර කිරීමේ වගන්ති ගිවිසුම් වලට යොදා ගැනීමේදී විකුණුම්කරුවෙකු අනුගමනය කළ යුතු රීති මොනවාදැයි විනිශ්චිත නඩු තීන්දු යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

(05) (අ) "මිල යනුවෙන් හඳුන්වනු ලබන මුදල් ප්‍රතිෂ්ඨාවක් සඳහා භාණ්ඩ වල අයිතිය විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත පැවරීම හෝ පැවරීම සඳහා එකඟවීමේ ගිවිසුමක් භාණ්ඩ විකිණීමේ ගිවිසුමකි." මෙම ප්‍රකාශය නිදර්ශන ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) දිනේෂ්, අනුෂාගේ උපන්දිනය සඳහා වටිනා ඇඳුමක් තෑගි කරයි. එම ඇඳුම ඇඳීමත් සමඟම අනුෂාට සමේ රෝගයක් වැළදෙයි. මෙම ඇඳුම. දිනේෂ් සී/ස ස්ටාර් ෆැෂන්ස් වෙතින් මිලදී ගෙන තිබුණි. එම ඇඳුමද ඇතුලත් වූ ඇඳුම් තොගයක් එම ආයතනයේ කළමනාකරු වන රෙජිනෝල්ඩ් විසින් සාම්පල් කිහිපයක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සී/ස නෙලුම් ගාමන්ට්ස් වෙතින් මිලදී ගෙන තිබුණි. අනුෂාට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා එම ඇඳුම මැසීම සඳහා යොදාගත් රෙදි වර්ගයේ තිබූ මතුපිටින් පරීක්ෂා කිරීමෙන් හෙළි නොවන්නාවූ දෝෂයක් හේතුකොට ගෙන අදාල රෝගය ඇයට වැළඳුනු බැව් සොයා ගන්නා ලදී.
දිනේෂ්, සහ ස්ටාර් ෆැෂන්ස් ආයතනයට මේ පිළිබඳව ඇති අයිතිවාසිකම් සහ ප්‍රතිකර්මයන් මොනවාදැයි භාණ්ඩ විකිණීමේ නීතිය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

(06) (අ) අමල්, බිමල් සහ කමල් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ විය. හවුල් ව්‍යාපාරය මඟින් එහි තරඟකරුවන්ගේ ව්‍යාපාර ගිවිසුම් පිළිබඳව තොරතුරු නිත්‍යානුකූල මාර්ගයෙන් ලබාගැනීම පිණිස අමල්ව පත් කළේය. අමල් තරඟකාරී හවුල් ව්‍යාපාරයක් පිළිබඳව රහස්‍ය තොරතුරු ලබා ගැනීම පිණිස එම ආයතනයේ ලිපිකරුවෙක් වෙත අල්ලස් ලබා දුන්නේය. අල්ලස් මුදල ව්‍යාපාරයට අයත් මුදලින් ලබා දුන් අතර, එලෙස ලබාගත් තොරතුරු මඟින් ලද ලාභ ව්‍යාපාරයේ වත්කම් වලට එකතු විය. දැන් තරඟකාරී ආයතනය කමල්ට එරෙහිව නඩු පැවරීමට අදහස් කරයි.

සිය සම හවුල්කරුවෙකු වූ අමල්ගේ ක්‍රියාව සම්බන්ධයෙන් බිමල් සහ කමල් වගකීමට ලක්වේදැයි විනිශ්චිත නඩු තීන්දු යොදාගනිමින් සලකා බලන්න.

(ලකුණු 10)

(ආ) හවුල් කරුවෙකුව හවුල් ව්‍යාපාරයෙන් නෙරපා දැමීමේ බලය හවුල් ව්‍යාපාරයකට ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

(07) (අ) අපරානුමැතිය මත ඇති වන නියෝජ්‍යත්වය යනු කුමක්ද? වලංගු අපරානුමැතියක් උදෙසා සපුරාලිය යුතු පූර්ව කොන්දේසි මොනවාදැයි සඳහන් කරන්න.

(ලකුණු 06)

(ආ) (i) "ඩෙලිගාටස් හොන් - පොටෙස්ට් ඩෙලි ගෙයාර්" යන රීතියෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 03)

(ii) මෙම රීතියට අදාල ව්‍යාතිරේඛ කවරේද?

(ලකුණු 03)

(ඇ) පළතුරු කි.ග්‍රෑ. 5000 ක් අලෙවි කිරීම පිණිස සිය නියෝජිතයා ලෙස සුනිමල්, විසින් නිමල්ව පත් කළේය. සුනිමල් නිමල් වෙත පළතුරු තොගය භාර දුන් අතර නිමල් ගැනුම්කරුවෙකු හමුවන තෙක් ඒවා සිය ගබඩාවේ තැම්පත් කළේය. දින තුනකට පසුව අදාල පළතුරු තොගය නශ්‍ය වීමට පටන් ගෙන ඇති බැව් නිමල් දැනගත් අතර, එසේ වුවහොත් සිය ගබඩාවේ ඇති අනෙක් භාන්ඩ වලටද හානි විය හැකි බැව් සිතන ඔහු එම පළතුරු තොගය ඉතා අඩු මිලකට විමල් වෙත විකුණුවේය. තමන් සතු නීතිමය අයිතීන් සම්බන්ධයෙන් සුනිමල් වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

(08) (අ) විනිමය බිල්පතක මූලික ලක්‍ෂණයන් මොනවාද?

(ලකුණු 06)

(ආ) විනිමය බිල්පතක සහ චෙක්පතක් අතර ඇති ප්‍රධාන වෙනස්කම් මොනවාද?

(ලකුණු 04)

(ඇ) අමල්, ධාරක බිල්පතක ආදායකයා විය. අදාල බිල්පත අමල් අතින් සිය කාර්යාලයේදී අස්ථානගත වන අතර පෙරේරා එය අහුලා ගනියි. පෙරේරා එම බිල්පත කසුන් වෙත භාරදෙන අතර ඔහු එය සද්භාවයෙන් අගනා ප්‍රතිෂ්ඨාවක් ගෙවා ලබා ගනියි. බිල්පතහි වර්තමාන දරන්නා වශයෙන් කසුන් සතු අයිතිවාසිකම් මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

(ඈ) "ගණුදෙනු කළ නොහැක." යනුවෙන් රේඛනය කළ චෙක්පතක් සහ "ආදායකයාගේ ගිණුමට පමණයි." යනුවෙන් රේඛනය කර ඇති චෙක්පතක් අතර පවතින ප්‍රධාන වෙනස්කම් කුමක්ද?

(ලකුණු 06)
(මුළු ලකුණු 20)